Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සති පාසල

සංයුක්ත ගණිතය — 13 ශ්‍රේණිය

සැකසුම - සාරංග පෙරේරා

නිපුණතා මට්ටම - 3.8 අවස්ථිති රාමුවකට සාපේක්ෂ ව සිදුවන චලිත පැහැදිලි කිරීමට නිව්ටන් නියම යොදා ගනියි.

<u>ගැටලු</u>

01)ස්කන්ධය 10kg වන අංශුවක් සුමට තිරස් මේසයක් මත නිසලව තබා මේසයේ තලයට සමාන්තර දිශාවක් ඔස්සේ අංශුවට 30N නියත බලයක් යොදනු ලැබේ.

i)පසුව සිදුවන චලිතයේ අංශුවේ ත්වරණය සොයන්න.

ii)තත්පර (15/3) කට පසුව අංශුවේ ප්‍රවේගය සොයන්න.

iii)මේසය මගින් අංශුව මත ඇතිකරන ප්‍රතික්‍රියාව සොයන්න.

02)තිරසට $30^\circ$ ආනත සුමට තලයක් මත තැබූ 8kg බර අංශුවක් මත ආනත තලයේ වැඩිතම බෑවුම් රේඛාව ඔස්සේ ඉහළට වූ දිශාව ඔස්සේ 64N බලයක් යොදනු ලැබේ.

i)අංශුවේ ත්වරණය සොයන්න.

ii)ආනත තලය මගින් අංශුව මත ඇතිවන ප්‍රතික්‍රියාව සොයන්න.